සෘණාත්මක සන්දර්භයන් තුළ, පුවතට සෘජුව අදාළ නොවන අවස්ථාවන්හිදී අදාළ පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමක වාර්ගිකත්වය සඳහන් කිරීමේ ගැටළුව වන්නේ, ඒ ඔස්සේ යම් යම් වාර්ගිකත්වයන් හෝ ජාතීන් සෘණාත්මකව ඒකාකෘතික කිරීම් වලට ලක්වීමේ ඉඩක් පවත්නා බැවිනි. අයෙකුගේ වර්ගය, කුලය, ආගම, ලිංගික නැඹුරුතා, ශාරීරික හෝ මානසික වෙනස්කම් පිළිබඳ විස්තර, ප්‍රවෘත්තියට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකිය යුත්තේය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළද දැක්වේ.

තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ, අපරාධ සහ නීති විරෝධී කටයුතු සම්බන්ධ පුවත් තුළ (උදා: මත් ජාවාරම් වැනි සිදුවීම්), කොවිඩ්-19 සම්බන්ධ පුවත් තුළ, සමාජ ප්‍රශ්න සම්බන්ධ පුවත් තුළ (උදා: දිවි තොර කරගැනීම්, දෙමාපියන් විසින් දරුවන්ව අත්හැර දැමීම් වැනි සිදුවීම්) අදාළ නොවන අවස්ථාවන්හි සෘණාත්මකව වාර්ගිකත්වයන් සඳහන්ව තිබූ වාර ගණන් පහත දත්ත සටහනේ දැක්වේ. කෙසේ නමුත්, සෘජුවම සෘණාත්මක සන්දර්භයන් නොවන එහෙත් පුවතට අදාළ නොවන විටක වාර්ගිකත්වය සම්බන්ධයෙන් සඳහන් කෙරී තිබූ අවස්ථාවන් මෙම දත්ත සටහනට ඇතුළත් කර නැත. 2020 ජනවාරි සිට 2021 ජූනි දක්වා කාල පරාසය තුළ දත්ත මෙම දත්ත සටහනට පාදක වී ඇත.

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

පුවතට අදාළ නොවන අවස්ථාවන්හි වාර්ගිකත්වය සඳහන් කිරීම් සම්බන්ධයෙන් මින් පෙර අප පළ කළ දත්ත සටහනට ප්‍රවේශය මෙතැනින්: **https://www.facebook.com/ethicseye/posts/1485233338498385**

**#MediaEthicsSL #lka #sinhalanews #SundayMawbima #Mawbima #SundayDivaina #Divaina #Aruna #SathiagaAruna #Silumina #Dinamina #SundayLankadeepa #Lankadeepa**